**ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 පෙබරවාරි 26 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 පෙබරවාරි 26 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයා ගේ වාර්තාව 2014 සැප්තැම්බර් 22 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය
------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
------------------------------------------------------------------------

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 1.24 පරිදි අයවැයගත සංඛ්‍යා හා සත්‍ය සංඛ්‍යා වෙන වෙනම නිරූපණය වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණු අතර අයවැයගත සංඛ්‍යා ඉක්මවා නැති බවට හෝ ඉක්මවා තිබෙන විට ඒවා මූල්‍ය ප්‍රකාශනවල පාද සටහනක් ලෙස හෝ අනාවරණය කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශ සමග ඉදිරිපත් කර තිබුණු මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ට අනුව පිළියෙල කර නොතිබුණු අතර, පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

I. ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම සඳහා 2013 වර්ෂයේ දී දැරූ රු. 304,462 ක වියදම ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි.

II. මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය යටතේ මුදල් ගලායාමක් ලෙස වර්ෂය තුළ දේශීය ණය හා සංවර්ධන අරමුදලේ ණය අපසු ගෙවූ මුදල වූ රු 404,528 වෙනුවට වර්ෂය අවසාන ණය ශේෂය වූ රු 2,958,835 සටහන් කර තිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ

(අ) ක්‍රියාත්මක ආදායම් (2/64) විෂය යටතේ 2013 නොවැම්බර් මස දක්වා ලැබී තිබුණු මුළු ආදායම වූ රු.475,039ක් දෙසැම්බර් මසතුලදී නැවතත් සාරාංශ ආදායම් ලේඛනයේ සටහන් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) ලැබිය යුතු ආදායම් සහ කලින් ලද ආදායම් වෙනම හදුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවද,සමාලෝචිත වර්ෂයේ අවසානයට ආදායම් විෂයන් 03කට අදාළව එකතුව රු.147,086ක් වූ කලින් ලද ආදායම් ජංගම වගකීම් යටතේ හෙළිදරව් කර නොතිබුණු අතර, ශේෂ පත්‍රෙය් හිඟ ආදායමට ගලපා හිලව් කර තිබුණි.

(ඇ) අවස්ථා 15ක දී දරන ලද එකතුව රු. 293,431ක් වූ ජල ව්‍යාපෘති අළුත්වැඩියා වියදම් අනුචිතව ප්‍රාග්ධන වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී ලැබුණ උසාවි දඩ මුදල් රු. 186,499ක් සහ මුද්දර ගාස්තු රු. 5,878,832ක් සමුච්චිත අරමුදලට බැරකළ යුතු වුවත්, එය සමාලෝචිත වර්ෂයට අදාල ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ආදායම එම මුදලින් වැඩි වී තිබුණි.

(ඉ) ලැබිය යුතු උසාවි දඩ රු. 273,576.ක් ආදායම් ණයගැතියෝ යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) 2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සේවක ණය මුදල මූල්‍ය ප්‍රකාශන අනුව රු. 1,706,193ක් වුවද, ණය ලේඛනය අනුව අයවිය යුතු රු. 2,800ක් වූ ණය ශේෂ දෙකක් එම ශේෂයට ඇතුළත් නොවීමෙන් අයවිය යුතු ණය මුදල එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වේ.

(උ) සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් බැහැර කර නොතිබුණු ප්‍රාදේශිය සභාවට අයත් ගොඩනැගිල්ලකින් ඉවත් කරන ලද දැව සහ සෙවිලි තහඩු වල විකිණීමට ඇස්තුමේන්තු කර තිබූ රු 35,000 ක් වූ මුදල , සාවද්‍ය ලෙස ගොඩනැගිලි ගිණුමට බැර කර තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාවර වත්කම් වල අගය, ප්‍රාග්ධන යෙදුමට ආදායමේන් දායක වීමේ ගිණුමට සමාන විය යුතු වුවත් රු 14,855,260 ක වෙනසක් තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය අවසානයට දේශිය ණය හා සංවර්ධන අරමුදල් ගිණුමේ පැවති ශේෂය වූ රු 18,147 ක අනුචිතව ශේෂ පත්‍රයේ සමුච්චිත අරමුදල හා සංචිත යටතේ දක්වා තිබුණි.

1.3.3 විගණනය සදහා සාක්ෂි ඉදිරිපත් නොවීම.
--------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරිම නිසා රු.13,907,962 ක් වූ ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස සත්නිරික්ෂණය කිරිමට නොහැකි විය.

1.3.4 නීති රීති රෙගුලාසි හා කළමණාකරන තීරණවලට අනුකූල නොවීම්

---------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති රෙගුලාසි හා කළමණාකරන තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීතිරීති හා රෙගුලාසියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 1.2.1(ඇ)ඡේදය | භාණ්ඩ හෝ සේවාවන් ලබාගැනීමේදී මිලගණන් කැඳවා සියලු සැපයුම්කරුවන්ට සමඅවස්ථාව ලබාදී සුදුසු සැපයුම්කරු තෝරාගැනීමට කටයුතු සිදුකලයුතු වුවද ඊට පටහැනිව පෞද්ගලික ආයතනයට ජලමෝටර් අළුත්වැඩියා සඳහා අවස්ථා11කදී රු.230,480ක් ගෙවීම් කර තිබුණි. |
| (ආ)2002 නොවැම්බර් මස 28 දිනැති අංකIAI/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | මිලදී ගනුලබන පරිගණක හා උපාංග සම්බන්ධව ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කළයුතු වුවත්, ආයතනය සතුව පවතින රු.258,118ක් වූ පරිගණක හා උපාංග සම්බන්ධව එවැනි ලේඛණයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 104(1) | 2011 ජුලි මස 10 දින සභාව සතු අංක 252-6347 කැබ් රථය අනතුරට පත් වී සිදු වූ රු.304,700 ක අලාභය සම්බන්ධව පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 1,846,670ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,316,007ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 8,162,677ක පිරිහීමක් ඇති වී තිබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

------------------------------------

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සමස්ත පුනරාවර්තන ආදායම රු. 5,030,600කින් අඩු වීමත්, මෙහෙයුම් හා උපකරන සහ ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව වෙනුවෙන් කළ වියදම ඉකුත් වර්ෂයට වඩා රු. 1,612,091කින් වැඩි වී තිබීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

---------------------

ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

-------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | තථ්‍ය ලැබීම් | දෙසැම්බර් 31 දිනට හිඟය |
|---|---|---|---|
| | (රු.) | (රු.) | (රු.) |
| වරිපනම් හා බදු | 110,745 | 102,809 | 72,207 |
| බලපත්‍ර ගාස්තුව | 825,000 | 75,458 | 70,420 |
| ජල ගාස්තු | 4,500,000 | 9,125,836 | 3,617,911 |

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 සහ ඊට පෙර වර්ෂ සඳහා හිඟව තිබූ ජල ගාස්තුව රු. 1,512,332කි. එය මුළු හිඟ ජල ගාස්තුවෙන් සියයට 41කි.

(ආ) 2012 හා ඊට පෙර වර්ෂ සඳහා හිඟව තිබූ වරිපනම් බදු රු. 46,717ක් වන අතර එය හිඟ වරිපනම් හා බදු මුදලෙන් සියයට 64කි.

(ඇ) 2011 ජුනි සිට 2012 ජුනි දක්වා කාලය අතර අයවිය යුතු මුද්දර ගාස්තු හා අය වූ මුද්දර ගාස්තු වටිනාකම අතර රු. 401,400 ක වෙනසක් පැවතුනි.

(ඈ) නව ජල සම්බන්ධතාවයක් ලබා දීමේ දී මීටර් ගාස්තු ලෙස අයකරනු ලබන රු. 7,500ක මුදල ජල සම්බන්ධතාවය ලබා දීමට ප්‍රථමව අයකළ යුතු වුවත්, එසේ කටයුතු නොකිරීම හේතුවෙන් 2009 වර්ෂයේ සිට ජල සම්බන්ධතා ලබා දුන් ස්ථානවලින් රු. 529,663ක හිඟ මීටර් ගාස්තුවක් අයවීමට තිබුණි.

(ඉ) 2012 නොවැම්බර් මස සිට 2013 සැප්තැම්බර් දක්වා අයවිය යුතු ලෙස හඳුනාගෙන ඇති රු. 5,567,190ක් වූ මුද්දර ගාස්තු අයකර ගැනීමට ක්‍රියා කර නොතිබුණි.

(ඊ) 2013 දෙසැම්බර් 31 දිනට හිඟව පැවති අක්කර බදු වටිනාකම රු. 299,685ක් වන අතරඉන් රු 177,125 ක් එනම් සියයට 59 ක ප්‍රමාණයක් වසර දෙකකට වඩා පැරණිය.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

----------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2013 වර්ෂය තුළ අවස්ථා 06ක දී එකතුව රු. 236,285ක මුදලක් යන්ත්‍ර කුලියට ගැනීම සහ ඉදිකිරීම් ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා රත්මලවින්න බලංගොඩ ලිපිනයේ පිහිටි A.I.T.C එන්ටප්‍රයිසස් නම් ආයතනය වෙත ගෙවා තිබුණි. මෙම ගෙවීම් සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

ගෙවීම් වවුචර් සමග අමුණා තිබූ මෙම ආයතනයේ ලිපි ශීර්ෂයේ සඳහන් 071083627 සහ 045-2286219 දරන දුරකථන අංක, ප්‍රාදේශීය සභා අරමුදලින් බිල්පත් ප්‍රතිපූර්ණය කරනු ලබන සභාපතිතුමාගේ පුද්ගලික දුරකථනය වන අතර, එම දුරකථනයන්හි බිල්පත් ප්‍රතිපූර්ණය සඳහා 2012 ජනවාරි මස සිට 2013 නොවැම්බර් මාසය දක්වා රු 69,000 ක් ප්‍රාදේශීය සභා අරමුදලින් ගෙවා තිබුණි. එම ගෙවීම් අනුව ඉහත සැපයීම් සහ සේවාවන් සඳහා සභාපතිවරයාගේ ඍජු මැදිහත් වීමක් පවතින බව නිරීක්ෂණය විය. මින් ඉදිරියේදි මෙම ආයතනයෙන් මිලදි ගැනීම් නොකරනු ලබන බව සභාපතිවරයා 2014 සැප්තැම්බර් 09 දින මා වෙත දන්වා තිබුණි.

(ආ) විදුලිය නිපදවීමට අදාලව පෞද්ගලික සමාගමක් සමග එළඹි ගිවිසුමේ පොරොන්දු ගිවිසිලි IV යටතේ නිපදවනු ලබන විදුලි ඒකක වෙනුවෙන් ගෙවනු ලබන මුදල පරිසරය සුරකීම සඳහා වූ පාරිසරික පුනර්ජීවන අරමුදලට බැර විය යුතුය. එසේ වුවද, ආරම්භයේ සිට 2013 ජුනි මස 30 දක්වා ලැබී ඇති රු. 1,940,585.85ක මුදල එලෙස අරමුදලකට බැර නොකර 2/64 අය ශීර්ෂය යටතේ ප්‍රාදේශීය සභා අරමුදලට බැර කර වියදම් කර තිබුණි.

3.2 මෙහෙයුම් හා කළමණාකරණ අකාර්යක්ෂමතා

---------------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) අළුත්නුවර පානීය ජල ව්‍යාපෘතියේ විදුලි මෝටර්හි විදුලිය පාලනය කිරීම සඳහා සවිකර තිබූ පැනල් පුවරුව අක්‍රිය වීම හේතුවෙන් එය අළුත්වැඩියා සඳහා පෞද්ගලික ආයතනයක් වෙත 2011 දෙසැම්බර් 16 දින රු. 70,000ක අත්තිකාරමක් ගෙවා තිබුණ ද ,2014ජුනි 02 වන දින වන විට ද පැනල් පුවරුව අළුත්වැඩියා කොට ආපසු භාරදී නොතිබුණ අතර ප්‍රමාදය සම්බන්ධයෙන් කිසිම ක්‍රියාමාර්ගයක් සභාව විසින් ගෙන නොතිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් වශයෙන් ලබා දී ඇති පියවී නොමැති ගිණුම් ශේෂයන්හි වටිනාකම රු. 5,056,213 ක් වූ අතර ඉන් රැ 2,866,459 ක් එනම් සියයට 57 ක ප්‍රමාණයක් වසර 5 කට වඩා පැරණි විය.

(ඇ) ජල විදුලි බලාගාරයක් අඛණ්ඩව ක්‍රියාත්මකව පැවතුන විට නිපදවනු ලබන විදුලි ඒකක (K.W.H.) ඒකාකාරී විය යුතුය. එසේ වුවද, සභාව සමග ගිවිසගත් විදුලි බල නිෂ්පාදන ආයතනයක වාර්තාව අනුව, විදුලි නිපයුමේ දැඩි විෂමතාවයක් පවතින අතර ලැබෙන්නා වූ ආදායමේ ද විචලනයන් දැක්වේ. ආයතනය විසින් ගණනය කර එවනු ලබන බදු මුදල ආදායමට ගෙන තිබුණ ද ලැබිය යුතු නියම ආදායම ලැබුණේ ද යන්න හඳුනාගැනීමට අභ්‍යන්තර පාලන ක්‍රියාදාමයක් අනුගමනය කර නොතිබුණි.

3.3 අවිධිමත් ගනුදෙනු

----------------------

පළාත් පාලන කොමසාරිස් (සබරගමුව) ගේ 2010 සැප්තැම්බර් 23 දිනැති අංක CLG 764 දරන චක්‍රලේඛයේ 06 වන ඡේදය ප්‍රකාරව යම් පළාත් පාලන ආයතන ප්‍රධානියෙකු, නියෝජ්‍ය ප්‍රධානියෙකු හෝ සභිකයෙකු විදේශ පුහුණු වැඩසටහනක් සඳහා තෝරාගත්තේ නම් අදාළ සංවිධානය හෝ විදේශ රාජ්‍ය

හෝ විදේශ ආයතනය හෝ ඒ සඳහා වැයවන සියළු වියදම් දැරිය යුතු බවත්, ඒ සඳහා රජයේ හෝ පළාත් සභාවේ හෝ පළාත් පාලන ආයතනයේ මුදල් නොයෙදවිය යුතු බවත් දක්වා ඇත. එහෙත් එම උපදෙස්වලට පටහැනිව සමාලෝචිත වර්ෂය තුලදී දින 6 ක තායිලන්ත සංචාරයක් සඳහා සභාවේ මහජන නියෝජිතයින් 04 දෙනකු වෙනුවෙන් සභා අරමුදලින් රු. 360,000ක් වියදම් කර තිබුණි.

3.4 ඌණ උපයෝජිත වත්කම්

-------------------------------

(අ) සභාවට අයත් කොන්ක්‍රීට් මිශ්‍රණය ලද දින සිට කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි.

(ආ) රජයේ සැපයුම් හා උපදේශාත්මක සේවා ඒකකයෙන් සභාව වෙත ලැබි තිබු අංක 53-5630 දරන කැබ් රථය සභාව පරිශ්‍රය තුල දිරා පත් වෙමින් පවතින අතර ,එය මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් මගින් විධිමත් පරිදි සභාව වෙත පවරා ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

3.5 කාර්ය මණ්ඩල පරිපාලනය

-------------------------------

සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ ආදායම් පරීක්ෂක නිලධාරී තනතුරු 02 ක් පුරප්පාඩුව පැවතියද අදාළ තනතුරු වල වැඩ ආවරණය ක්ෂේත්‍ර කම්කරුවෙකුට පවරා තිබුණි.

4. පද්ධති හා පාලන

------------------- --

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) අයවැය පාලනය.